## වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින වෙළඳ ප්‍රචාරණ නිලධාරී සහ විගණන නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට නියමිත සුදුසුකම්ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## වෙළඳ ප්‍රචාරණ නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (JM 1-1)

**රැකියා පිරිවිතරය :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ප්‍රචාරණයට අවශ්‍ය පරිදි තේ කර්මාන්තය පිළිබඳ වෙළඳපල දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා ප්‍රචාරණ කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් (I හෝ II)**

I. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අලෙවිකරණය / වාණිජ්‍ය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබාදෙමින් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

II. බ්‍රිතාන්‍ය වරලත් අලෙවිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්ව (CIM-UK) ලබා තිබීම

සහ

උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (I හෝ II)**

I. උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම් සපුරා තිබීම

හෝ

II. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

සහ

III. අලෙවිකරණය පිළිබඳ පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමාවක් හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

## විගණන නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (JM 1-1)

**රැකියා පිරිවිතරය :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත අභ්‍යන්තර විගණන සැලසුම අනුව විගණන කටයුතු සිදු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

I. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය / මූල්‍ය / වාණිජ්‍යය පිළිබඳ විශේෂ උපාධිය

හෝ

II. ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA)

හෝ

III. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙහි (ICASL) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයෙහි (CIMA) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම

සහ

උපාධිය, ඩිප්ලෝමාව හෝ වෘත්තීය සුදුසුකම ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම් සපුරා තිබීම

හෝ

II. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

**වැටුප් පරිමාණය :**

JM 1-1 2016 රු. (42,600 - 10 x 755 - 18 x 1135 - 70,580) මාසික

කළමනාකරණ චක්‍රලේඛ 02/2016 අනුව රු. 42,600/- මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව රු. 7800/- ගෙවනු ලැබේ.

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

**තෝරා ගැනීම :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**වෙනත් ප්‍රතිලාභ :**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ / ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.

**පොදු කොන්දේසි :**

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදු කරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.

**සටහන :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විගණන නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා 2019.08.11 දිනැතිව පළ කරන ලද පුවත්පත් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ. ඒ අනුව මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් නම අයදුම්පත් නැවත ඉදිරිපත් කළ යුතු වේ.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ http:/www.srilankateaboard.lk වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2020 අගෝස්තු 12 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර, කොළඹ 3.**